## උතුරු පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරීන් (සිවිල් හා විදුලි) III වන ශ්‍රේණියේ හා පුහුණු ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වූ විවෘත තරග විභාගය - 2018

උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරීන් (සිවිල් හා විදුලි) යන තනතුරු සඳහා I වගුවේ දක්වා ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විවෘත තරග විභාගයක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් **2018 දෙසැම්බර් මාසය වන විට** යාපනයේ පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් දන්වනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වනුයේ **26.11.2018** දිනයි.

- **වගුව – I**

| අංක | විභාගයේ නම | විභාග අංක | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරීන් සිවිල් (Civil) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2018 | I | 36 |
| 02 | උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරීන් සිවිල් (Civil) පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2018 | II | |
| 03 | උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරීන් විදුලි (Electrical) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2018 | III | 02 |
| 04 | උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරීන් විදුලි (Electrical) පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2018 | IV | |

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **01.06.2013** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද **වගුව - I** හි දක්වා ඇති පළාත් තාක්ෂණික සේවයේ තනතුරුවලට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීම් ක්‍රමයේ නිර්දේශ කර ඇති කොන්දේසීන්, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/A6/DCS(Adm)/Appr/TO/2018 හා 2018.09.07 වැනි දින දරණ ලිපිය, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මූල්‍ය ප්‍රඥප්තීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා ආයතන ක්‍රියා පරිපාටි සංග්‍රහය යනාදීන්ටත් මතු පැමිණෙන කාලවලදී ක්‍රියාත්මක වන යම්කිසි සංශෝධනයන්ට ද යටත්ව තෝරාගන්නා විභාග අපේක්ෂකයන් **I වගුවේ** දක්වා ඇති තනතුරුවලට III වන ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණීන් සඳහා පත්කිරීමට නියමිතය.

02.2 විවෘත තරග විභාගය මගින් පත්වීම් සඳහා තෝරා ගන්නා ලද විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනක් (03) පරිවාස කාලයට යටත් වූ පදනම මත තාක්ෂණික නිලධාරී III වන ශ්‍රේණියේ (සිවිල් හා විදුලි) තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි ඉහත සඳහන් **I වැනි වගුවේ** සඳහන් තනතුරුවල III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක (03) කාලය තුළ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 විවෘත තරග විභාගය මගින් පුහුණු ශ්‍රේණියේ පත්වීමට තෝරා ගන්නා ලද විභාග අපේක්ෂකයන් තාක්ෂණික නිලධාරී (සිවිල් හා විදුලි) තනතුරුවල පුහුණු ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම පුහුණුකරුවන්ට නියම කොට වෙන් කරන ලද පුහුණු කාලය අවසානයේ සුදුසුකම් බැලීමේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි. මෙම පරීක්ෂණයෙන් සමත් වුවොත් පමණක් මොවුන්ට III වන ශ්‍රේණිය සඳහා පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

02.4 මෙම සේවාවන් ස්ථාන මාරුවීම් වලට යටත් වූ සේවාවන් වේ. එබැවින් මෙම පත්වීම් ලබන්නන් උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන නියෝගයට යටත් විය යුතුයි.

02.5 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අපේක්ෂකයෙක්, එම සේවා ස්ථානයේ අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවය කළ යුතුයි යන්න අත්‍යාවශ්‍ය නියෝගයකි.

02.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අදාල සියළුම චක්‍රලේඛවලට අනුව පත්වීම් දින සිට වසර පහක් (05) අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතුයි.

02.7 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දින යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත් කිරීමට නියමිත සංඛ්‍යාව **I වගුවේ** පෙන්වා ඇති පරිදි වේ. කෙසේ වුවද දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීම සම්බන්ධ බලතල පත්වීම් බලධාරියා සතුවේ.

## 03. වැටුප් පරිමාණය :-

**03.1 පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරීන් සිවිල්, විදුලි III වන ශ්‍රේණියේ තනතුර සඳහා:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **MN 3 - 2016** ට අනුව **I වගුවේ** සඳහන් තනතුරුවල III වන ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ **රුපියල් 31,040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57,550/-** කි. (රුපියල් 32,375/- යන වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි) කෙසේ වූව ද ඉහත චක්‍රලේඛයේ **II වගුවේ** සඳහන් විධිවිධානවලට අනුව වැටුප් ගෙවනු ලැබේ.

**03.2 පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී සිවිල් හා විදුලි පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, එම චක්‍රලේඛයේ **V – වන වගුවේ** සඳහන් විධිවිධානයන් ප්‍රකාර මාසික දීමනාව හා ගැලපුම් දීමනාව යනාදි ගෙවනු ලැබේ.

| | | |
|---|---|---|
| 1 මු වර්ෂය - | රුපියල් 21,532.00 | හා ගැලපුම් දීමනාව |
| 2 වන වර්ෂය - | රුපියල් 21,770.00 | |

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි..

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයන් ද විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාත ස්ථිර පදිංචිය කරගත් අයෙකු විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසානට දිනට ප්‍රථම අවුරුදු හයක (06) කාල පරිච්ඡේදයෙන් අවම වශයෙන් අවුරුදු (03) ක් උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිවී සිටිය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොටගෙන තිබිය යුතු අතර අවම වශයෙන් අවුරුදු පහක් (05) ක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම සේවක නිලධාරි විසින් නිකුත් කරන සහතිකය හෝ ඡන්ද හිමි නාම ලේඛනයේ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04.4.1 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **දහඅටට (18)** නොඅඩු, **වයස අවුරුදු තිස් පහට (35)** නොවැඩිව තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-

සෑම තනතුරක් සඳහා ම අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසකම් යනුවෙන් මෙම නිවේදනයේ **II වන වගුවේ** සඳහන් කර ඇත. අයදුම් කරන අයදුම්කරුවන් සියළු දෙනාම තම සුදුසුකම්වලට වඩාත් ගැලපෙන තනතුරට පමණක් අයදුම්කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මෙම අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ඉල්ලා ඇති සියළුම සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුයි. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 06 බඳවා ගන්නා ක්‍රමය :-

06.1 ලිඛිත විභාගය මගින් හා කුසලතාව පදනම් කරගෙන්, බඳවා ගන්නා අවස්ථාවේ බලගන්වා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගන්නා සැලැස්ම, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන්ට යටත්ව හා I වන වගුවේ දක්වා ඇති තනතුරුවලට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවන ලද සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව දැනුවත් වූවහොත් මෙම තනතුර සඳහා ඇති අයිතිවාසිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සුදුසුකම් හා ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

06.2 ඉහත ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩුවලට අනුව සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

06.3 තාක්ෂණික නිලධාරි (සිවිල් හා විදුලි) වැනි තනතුරුවල **III** වන ශ්‍රේණියට ඍජු බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. බඳවා ගැනීමේ ශ්‍රේණිය වන තාක්ෂණික නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති අවස්ථාවකදී **ඉතිරි පුරප්පාඩු පුහුණු ශ්‍රේණියේ** බඳවා ගැනීම් සමග පූර්ණය කරනු ලැබේ.

06.4 තාක්ෂණික නිලධාරි (සිවිල් හා විදුලි) යන තනතුරුවල බඳවා ගැනීම්, මෙම තනතුරු සඳහා වන බඳවා ගැනීම් සැලසුමේ **7.2.3.V ඡේදය** ප්‍රකාර දිස්ත්‍රික්කය නියෝජනය වන පදනම මත සිදු කරනු ලැබේ.

06.5 පුරප්පාඩුවලින් 03% විශේෂ අවශ්‍යතා ඇති (ආබාධිත) අය සඳහා වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා පත්වීම් සඳහා තෝරා ගන්නා විට අදාල තනතුරේ සේවය කිරීම සඳහා තම විශේෂ අවශ්‍යතාවයේ තත්වය (Disability) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් ඔප්පු කළ යුතුයි. එසේ වුවත් විශේෂ අවශ්‍යතාවයක් ඇති විභාග අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමේ පදනම මතයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ අංක **"3401"** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලැබෙන අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා මාරු කිරීමට ද අවස්ථාව දෙනු ලබන්නේ නැත.

## 08. අයදුම්කරන ක්‍රමය :-

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 10 දක්වා ඡේද පළමු පිටුවේ ද 11 සිට 14 දක්වා ඡේද දෙවන පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **26.11.2018** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

08.2 එක් තනතුරකට අමතරව තරග විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇති අය එක අයදුම්පතක් පමණක් සම්පූර්ණ කර යොමු කළ යුතු බවත් මෙම විභාග ගාස්තුව එක් වරක් පමණක් ගෙවීම ප්‍රමාණවත් වේ,

08.3 අයදුම්පත / අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරි (සිවිල් හා විදුලි) යන තනතුරුවල III වන ශ්‍රේණියේ හා පුහුණු ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2018"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාල තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.4 අයදුම්පතේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදී භාරගනු නොලැබේ. විභාගය සඳහා විභාග ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ සැළකිය නොයුතුයි.**

08.5 අයදුම්පත් ඉදිරිපත් කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ හා සම්බන්ධ පුවත්පත් නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයෙකුට දැන්වීම නිකුත් කර විභාග දිනයට අඩුම වශයෙන් දින තුනකට (03) පෙර හෝ විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම්, ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමග

**"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**සටහන :-**

ප්‍රවේශපත්‍රය සම්බන්ධ ඉල්ලීම් ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.6 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසුකම් පූර්ණය කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ

**09. විභාග අපේක්ෂකගේ අනන්‍යතාවය :-**

අපේක්ෂකයන් තමා පෙනී සිටින එක් එක් විෂයයන් සම්බන්ධයෙන් අධීක්ෂක සෑහීමකට පත්වන ආකාරයකට ඔබගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් යම්කිසි ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම්පත් අංකය
(ii) වලංගු විදේශ බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයෙකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත විසින් අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන දඬුවමකට යටත් විය යුතුයි.

**10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-**

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රේගුලාසින් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයාට සුදුසුකම් නැති බව අනාවරණය වූවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

**11. අත්සන සහතික කිරීම :-**

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මඟින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදා යනාදියේ අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් 395,520.00 ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් යන අයගෙන් කෙනෙකු ස්ථිර කළ යුතුයි.

**12. විභාග සැලැස්ම :-**

12.1 **උතුරු පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරීන් (සිවිල්) III වන ශ්‍රේණියේ හා පුහුණු ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම**

මෙම ලිඛිත විභාගය පහත සඳහන් කර ඇති පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් දෙකකින්ම පැවැත්වීමට නියමිතය. අයදුම් කරන ලද භාෂාව මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නැති අතර මෙම ලිඛිත විභාගයට පෙනී සිට සමත්වීමට අපොහොසත් වූ කිසියම් විභාග අපේක්ෂකයෙක් නැවත නිවැරදි කිරීම් සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු යොදා නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රවල අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරු විමර්ශණ කටයුතු වලට අදාල කරුණු සඳහා විභාග අපේක්ෂකයන් ප්‍රවේශවීමේ හැකියාව, තීරණාත්මක හැකියාව හා විශ්ලේෂණය අත්හදා බැලීමේ හැකියාව යනාදිය අගය කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 02. | තාක්ෂණය හා සම්බන්ධ පරීක්ෂණය | අයදුම්කරුගේ ගොඩනැගිලි නිර්මාණය සම්බන්ධ මූලික දැනුම, ගොඩනැගිලිවලට අවශ්‍ය අමුද්‍රව්‍ය, ගොඩනැගීම් කටයුතු සඳහා අවශ්‍ය සැලැස්ම (Plan) සකස් කිරීම හා සැලැස්ම (Plan) තේරුම් ගැනීම, මැනීම, පදනම, පසේ ප්‍රවර්ගය, වීදි නිර්මාණය හා නඩත්තුව, ඇස්තමේන්තු සකස් කිරීම, ජල සම්පාදනය, කාණු සකස් කිරීම හා කසල ඉවත් කිරීම යනාදි කරුණු සම්බන්ධ දැනුම අගය කිරීම සඳහා සකස් කරන ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 |

**12.2 උතුරු පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරීන් විදුලි (Electrical) III වන ශ්‍රේණියේ හා පුහුණු ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම**

මෙම විභාගය පහත සඳහන් කර ඇති පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් දෙකකින්ම පැවැත්වීමට නියමිතය.. අයදුම් කරන ලද භාෂාව මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නැති අතර මෙම ලිඛිත විභාගයට පෙනී සිට සමත්වීමට අපොහොසත් වූ කිසියම් විභාග අපේක්ෂකයෙක් නැවත නිවැරදි කිරීම් සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු යොදා නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රවල අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරු විමර්ෂණ කටයුතු වලට අදාල කරුණු සඳහා විභාග අපේක්ෂකයන් ප්‍රවේශවීමේ හැකියාව, තීරණාත්මක හැකියාව හා විශ්ලේෂණය අත්හදා බැලීමේ හැකියාව අගය කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි | පැය 01 | 100 |
| 02. | තාක්ෂණය හා සම්බන්ධ පරීක්ෂණය | විදුලි පරිපථය සම්බන්ධව හා (Electric Circuits), විදුලිය සම්බන්ධ රෙගුලාසින් (Electrical Regulations), සැලැස්ම පිළිබඳ දැනුම (Knoweldge on Plans), ඇස්තමේන්තු සකස් කිරීම හා පරිපථ පරීක්ෂා කිරීම් (Preparation of estimates and testing of circuits) යනාදි කරුණු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 |

**සටහන්** :-

මෙම විභාගය එක් තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතුයි.. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

**13.** විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මඟින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයෙකුටම වෙන වෙනම තැපැල් මඟින් නිකුත් කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

***අ. සිවපාලසුන්දරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත්.
25.10.2018

## අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

| අනු අංකය | තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 01 | **තාක්ෂණික නිලධාරීන් විදුලි III වන ශ්‍රේණිය** | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයයන් ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් **හයක් (06)** සමත්වී තිබිය යුතුයි.<br>**ඒ සමඟම**<br>අ.පො.ස (උ/පෙ) විභාගයෙන් ගණිතය ක්ෂේත්‍රයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළු ප්‍රධාන විෂයයන් **තුනක් (03)** එකවර සමත්වී තිබිය යුතු. | (1) මොරටුව විශ්වවිද්‍යාලයෙන් නැතිනම් අම්පාර හාඩි තාක්ෂණික ආයතනයෙන් ප්‍රදානය කරන ලද ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.<br>**හෝ**<br>(2) ජාතික පුහුණු හා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ප්‍රදානය කරන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.<br>**හෝ**<br>(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.<br>**හෝ**<br>(4) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයකින් ප්‍රදානය කරන ලද තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.<br>**හෝ**<br>(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් (IESL) පවත්වනු ලබන ඉංජිනේරු (සිවිල්) විභාගයෙන් පළමු කොටස තෘප්තිමත් ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි.<br>**හෝ**<br>(6) තාක්ෂණික නිලධාරි (සිවිල්) ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම - VI සම්පූර්ණ කළ යුතුයි.<br>**හෝ**<br>(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික විද්‍යා සහතිකය නිකුත් කරන ආයතන වලින් අදහස් ලබා ගත් පසු ඉහත තාක්ෂණික සුදුසුකම් වලට සියළු ආකාරයෙන්ම සමාන තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් තාක්ෂණික සුදුසුකම්. |
| 02 | **තාක්ෂණික නිලධාරීන් (සිවිල්) පුහුණු ශ්‍රේණිය (පුහුණු කාලය වසර 01 යි)** | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව් යන විෂයයන් ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් **හයක් (06)** සමත්වී තිබිය යුතුයි.<br>**ඒ සමඟම**<br>අ.පො.ස (උ/පෙ) විභාගයෙන් ගණිතය ක්ෂේත්‍රයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළු ප්‍රධාන විෂයයන් **තුනක් (03) එකවර** සමත්වී තිබිය යුතුයි. | 1. තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත තාක්ෂණික විද්‍යාලයක ජාතික තාක්ෂණ විද්‍යා සහතික (NCT) (සිවිල්) ලබාගත යුතුයි.<br>**හෝ**<br>2. තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත තාක්ෂණික විද්‍යාලයක වෘත්තීය ක්ෂේත්‍රයේ අයදුම් කරන තනතුරට ගැලපෙන ජාතික සහතික පාඨමාලාව (NCC) ((සිවිල්) තෘප්තිමත් ලෙස හදාරා අදාල සහතිකය ලබා තිබිය යුතුයි.<br>**හෝ**<br>3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික විද්‍යා සහතික නිකුත් කරනු ලබන ආයතවලින් අදහස් ලබාගත් පසු ඉහත තාක්ෂණික විද්‍යා සුදුසුකම්වලට සියළුම ආකාරයේ සමානත්වයක් දක්වන තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් තාක්ෂණික සුදුසුකම්. |
| 03 | **තාක්ෂණික නිලධාරීන් (සිවිල්) පුහුණු ශ්‍රේණිය (පුහුණු කාලය වසර 02 යි)** | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව් යන විෂයයන් ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් **හයක් (06)** සමත්වී තිබිය යුතුයි.<br>**ඒ සමඟම**<br>අ.පො.ස (උ/පෙ) විභාගයෙන් ගණිතය | අදාල නැත |

| | | | |
|---|---|---|---|
| | | ක්ෂේත්‍රයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළු ප්‍රධාන විෂයයන් **තුනක් (03) එකවර** සමත්වී තිබිය යුතුයි. | |
| 04 | **තාක්ෂණික නිලධාරීන් (විදුලි) II වන ශ්‍රේණිය** | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් **හයක් (06)** සමත්වී තිබිය යුතුයි.<br>**ඒ සමඟම**<br>අ.පො.ස (උ/පෙ) විභාගයෙන් ගණිතය ක්ෂේත්‍රයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළු ප්‍රධාන විෂයයන් **තුනක් (03) එකවර** සමත්වී තිබිය යුතුයි. | (1) මොරටුව විශ්වවිද්‍යාලයෙන් නැතිනම් අම්පාර හාඩි තාක්ෂණික ආයතනයෙන් ප්‍රදානය කරන ලද ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා (විදුලි) සහතිකය.<br>**හෝ**<br>(2) ජාතික පුහුණු හා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ප්‍රදානය කරන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (විදුලි) සහතිකය.<br>**හෝ**<br>(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (විදුලි) සහතිකය.<br>**හෝ**<br>(4) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයකින් ප්‍රදානය කරන ලද තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා (විදුලි) සහතිකය.<br>**හෝ**<br>(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් (IESL) පවත්වනු ලබන විදුලි ඉංජිනේරු විභාගයෙන් පළමු කොටස තෘප්තිමත් ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි.<br>**හෝ**<br>(6) තාක්ෂණික නිලධාරි (විදුලි) ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම VI සම්පූර්ණ කළ යුතුයි.<br>**හෝ**<br>(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික විද්‍යා සහතිකය නිකුත් කරන ආයතන වලින් අදහස් ලබා ගත් පසු ඉහත තාක්ෂණික සුදුසුකම් වලට සියළු ආකාරයේ සමානත්වයක් දක්වන තෘතීයික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් තාක්ෂණික සුදුසුකම්. |
| 05 | **තාක්ෂණික නිලධාරීන් (විදුලි) පුහුණු ශ්‍රේණිය (පුහුණු කාලය වසර 01 යි)** | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් **හයක් (06)** සමත්වී තිබිය යුතුයි.<br>**ඒ සමඟම**<br>අ.පො.ස (උ/පෙ) විභාගයෙන් ගණිතය ක්ෂේත්‍රයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළු ප්‍රධාන විෂයයන් **තුනක් (03) එකවර** සමත්වී තිබිය යුතුයි. | 1. තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත තාක්ෂණික විද්‍යාලයක ජාතික තාක්ෂණ විද්‍යා සහතික (NCT) (විදුලි) ලබාගත යුතුයි.<br>**හෝ**<br>2. තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත තාක්ෂණික විද්‍යාලයකින් වෘත්තීය ක්ෂේත්‍ර තාක්ෂණික ක්ෂේත්‍රයට අදාල අයදුම් කරන තනතුරට ගැළපෙන ජාතික සහතිකපත්‍ර පාඨමාලාව (NCC) (විදුලි) තෘප්තිමත් ලෙස හදාරා සහතික ලබා තිබීම.<br>**හෝ**<br>3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික විද්‍යා සහතිකය නිකුත් කරන ආයතන වලින් අදහස් ලබා ගත් පසු ඉහත තාක්ෂණික සුදුසුකම් වලට සියළු ආකාරයෙන්ම සමාන තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් තාක්ෂණික සුදුසුකම් |

| | | | |
|---|---|---|---|
| 06 | **තාක්ෂණික නිලධාරීන් (විදුලි) පුහුණු ශ්‍රේණිය (පුහුණු කාලය වසර 02 යි)** | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයයන් ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් **හයක් (06)** සමත්වී තිබිය යුතුයි.<br>**ඒ සමගම**<br>අ.පො.ස (උ/පෙ) විභාගයෙන් ගණිතය ක්ෂේත්‍රයේ ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සමඟ භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළු ප්‍රධාන විෂයයන් **තුනක් (03) එකවර** සමත්වී තිබිය යුතුයි. | අදාල නැත |

**සටහන :-**

01. විවෘත තරඟ විභාගය පදනම් කොට ගෙන පුහුණු ශ්‍රේණියට (සිවිල් හා විදුලි) පත් කරන ලද අයදුම්කරුවන්, බඳවා ගැනීමේ ක්‍රමයේ නියමිත පුහුණු කාලය තෘප්තිමත් ලෙස අවසන් කර අවසන් පරීක්ෂණයෙන් සමත් බවට අදාල ආයතනය විසින් සනාථ කර ප්‍රදානය කරන ලද ප්‍රතිඵල ඉදිරිපත් කිරීමෙන් අනතුරුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

02. පුහුණුව අවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු කාලය **මාස (06)** කට නොවැඩි කාලයකට දීර්ඝ කිරීමට අවස්ථාව දෙනු ලැබේ. දීර්ඝ කරන ලද පුහුණු කාලය අවසානයේ නැවත පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත් නොවන විවෘත තරඟ විභාගය යටතේ බඳවා ගත් අභ්‍යාසලාභීන්ගේ සේවය අවසන් කරනු ලැබේ.